වි. සුතේයෙව්



# කතන්දර හා පින්තූර






මම චිත්‍ර ශිල්පියෙක්.

කුඩා කාලෙ ඉඳල මම වම් අතින් අඳින්න පුරුදු වුණා. දකුණු අතින් ලියන්න ඉගෙන ගත්තා. ලියන්න ඕනෑ දකුණු අතින් විතරමයි. දැන් මම කතන්දරයක් ගැන හිතනකොට දකුණු අතේ පෑන. වම් අතේ පැන්සලය නැත්නම් පින්සල. ඒක හුඟක් පහසුයි. දකුණු අතින් කතන්දරය ලියනවා. ඒ අතර වම් අතින් විනෝදමත් විහිළු චිත්‍ර අඳිනවා.

බාගදා අනික් අතට වෙන්නත් පුළුවන්. ඉස්සරවෙලා වම් අතින් චිත්‍ර අඳිනවා. ඊට පස්සෙ දකුණු අතින් ඒකට ගැලපෙන කතන්දරය



වී. සුතේයෙව්

# කතන්දර හා පින්තූර







වි. සුතේයෙව්

# කතන්දර හා පින්තූර

චිත්‍ර: සුතේයෙව් විසිනි



අනුවාදය
පද්ම හර්ෂ කුරණගේ



# කතන්දර හා පින්තූර

## වී. සුතේයෙව්

චිත්‍ර | වී. සුතේයෙව්

අනුවාදය | පද්ම හර්ෂ කුරණගේ

නව පරිගණක සකැසුම | මාලක ලලනජීව

ප්‍රකාශනය | සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

මුද්‍රණය | Kanol PRINT

ප්‍රථම මුද්‍රණය | 2013





කුකුල් පැටියා හා තාරා පැටියා ........................ 7

පූස් පැටව් තුන් දෙනා ........................ 15

හත්ත යට ........................ 25

"ඤාව්" කීවෙ කවුද? ........................ 39

නොගැලපෙන රෝද ........................ 57

ඔරුව ........................ 67

පොල්ලෙ බලේ ........................ 75

ඇපල් ගෙඩිය ........................ 89


මීයා හා පැන්සලය ........................ 99

කුකුළා හා පාට ........................ 107

දඟකාර පූසා ........................ 115

නත්තල් ගහ ........................ 127

මොකාද මේ කුරුල්ලා ........................ 147





# කුකුල් පැටියා
හා
# තාරා පැටියා



තාරා පැටියා බිත්තරයෙන් එළියට ආවා.
"මම එළියට ආවා!" ඔහු කීවා.



"මමත් එළියට ආවා" කුකුල් පැටියා කීවා.



“මම ඇවිදින්න යනවා” තාරා පැටියා කීවා.
“මමත් ඇවිදින්න යනවා” කුකුල් පැටියා කීවා.



“මම ගුලක් හාරනවා” තාරා පැටියා කීවා.
“මමත් හාරනවා” කුකුල් පැටියා කීවා.



"මම පණුවෙක් හොයා ගත්තා" තාරා පැටියා කීවා.
"මමත් හොයාගත්තා" කුකුල් පැටියා කීවා.



"මම සමනලයෙක් ඇල්ලුවා" තාරා පැටියා කීවා.
"මමත් ඇල්ලුවා" කුකුල් පැටියා කීවා.



“මට නාන්න ඕන” තාරා පැටියා කීවා.
“මටත් නාන්න ඕන” කුකුල් පැටියා කීවා.



“මම පීනනවා” තාරා පැටියා කීවා.



“මමත් පීනනවා!” කුකුල් පැටියා කෑගැහුවා.



“බේරාගනිල්ලා!...”



තාරා පැටියා කුකුල් පැටියව බේරාගත්තා.



"මම ආයෙත් නාන්න යනව" තාරා පැටියා කීවා.
"මම යන්නෙ නෑ" කුකුල් පැටියා කීවා.


USSR
පෙරදිග



# පුස් පැටව් තුන්දෙනා





කළු, අළු, සුදු පූස් පැටව් තුන් දෙනා



මීයෙකුව දැකලා



....ඌ පස්සෙ එළවනවා!




මීයා පැන්නා පිටි භාජනේකට.




පූස් පැටියොත් ඒකට පැන්නා! මීයා පැනල දිව්වා.




පිටි භාජනෙන් සුදු පූස් පැටව් තුන්දෙනෙක් එළියට ආවා.



සුදු පූස් පැටව් තුන්දෙනා මිදුලෙදි ගෙම්බෙකුව දැකල ඌ පස්සෙන් එළෙව්වා!



ගෙම්බා පරණ කේතල බොයිලේරුවකට පැන්නා. පූස් පැටියොත් ඒකට පැන්නා!



ගෙම්බා පැනල දිව්වා...



...බොයිලේරුවෙන් කළු පූස් පැටව් තුන්දෙනෙක් එළියට ආවා.



කළු පූස් පැටව් තුන්දෙනා පොකුණේ මාළුවෙකුව දැකල...



.....ඌව අල්ලාගන්න දිව්වා!




මාළුවා පීනල ගියා....




.....තෙතබරියන් වුණු පූස් පැටව් තුන්දෙනෙක් පොකුණෙන් ආවා.



තෙත පූස් පැටව් තුන්දෙනා ගෙදර ගියා.



ගෙදර යනකොට උන්ගේ ඇඟවල් වේලුණා. දැන් කලින් හිටිය කළු, අළු, සුදු පාට පූස් පැටව් තුන්දෙනාමයි.



# ගත්ත යම





දවසක් කූඹියෙක් තද වැස්සට අහුවුණා.

කොහේ හැංගෙන්න ද?


කූඹියා දැක්කා එළිමහන් පිට්ටනියෙ හත්තක් තියෙනවා. ඌ දුවල දුවල ගිහින් හත්ත යට හැංගුණා.

කූඹියා හත්ත යටට වෙලා වැස්ස පායනකල් ඉන්නවා.

වැස්ස තව තවත් තදින් වහිනවා....

හත්ත ළඟට තෙත සමනලයෙක් බඩ ගාගෙන එනවා.

"කූඹියෝ, කූඹියෝ,
මාවත් හත්ත යටට ගනින්.
මම හොඳටම තෙමුණා.
ඉගිල්ලෙන්න බෑ !"





''උඹට ඉඩදෙන්නෙ කෙහොමද? මමත් මෙතන ඉන්නෙ අමාරුවෙන්'' කූඹියා කියනවා


''කමක් නෑ ! තෙරපිලා හරි කරදර නොකර ඉඳිමු'' කූඹියා සමනලයාට හත්ත යට ඉඩ දුන්නා.

වැස්ස තවත් තදින් වහිනවා...

ඒ ළඟින් මීයෙක් දුවනවා. ''මාවත් හත්ත යටට ගනිල්ලා ! මගෙ ඇඟෙන් වතුර බේරෙනවා'' මීයා කියනවා.

''උඹට කොහේ ඉඩ දෙන්න ද? මෙතන ඉඩ නෑ.''

''ටිකක් තෙරපිලා ඉඳිමු !''





උන් මීයාට හත්ත යට ඉඩ දුන්නා.
මොර සූරන වැස්ස. පායන්නෙ නෑ...


හත්ත ළඟ ගේකුරුල්ලෙක් උඩ පැන පැන අඬනවා.

''පිහාටු තෙමුණා, පියාපත් රිදෙනවා ! මාවත් හත්ත යටට ගනිල්ලා, වේලෙන්න. ගිමන් අරින්න, වැස්ස පායන කල් !''

''මෙතන ඉඩ නෑ''

''අනේ ටිකක් ඉඩ දීපල්ලා !''

''හොඳයි''





ඉතින් ගේකුරුල්ලට ඉඩ ලැබුණා.

පිට්ටනියට පැන පැන ආපු හාවෙක් දක්කා හත්ත.

''මාව හංගපල්ලා, බේරාගනිල්ලා ! මා පස්සෙන් නරියෙක් එලවාගෙන එනවා!..''

හාවා ගැන දුකයි. ''අපි තව ටිකක් කිට්ටු වෙමු'' කුඹියා කියනවා.





හාවාව හැංගුවා විතරයි, මෙන්න නරියා දුවගෙන එනවා.
''හාවා දැක්කෙ නැද්ද?'' නරියා අහනවා.
''දැක්කෙ නෑ''

නරියා තවත් කිට්ටුවට ඇවිල්ලා ඉව කෙරුවා.
''මෙතනද ඌ හැංගුණේ?''
''කොහෙද ඌ මෙතන හැංගෙන්නෙ!''
නරියා වල්ගය වනල යන්න ගියා.





මේ අතර වැස්ස පෑව්වා - ඉර එබී බැලුවා.

ඔක්කොම හත්ත යටින් එළියට ආවා.

සන්තෝස වෙනවා.

කුඹියා හිතල-මතල මෙහෙම කියනවා. "ඒ කොහොමද? කලින් තනි මට හත්ත යට තදබදේට ඉන්න සිද්ද වුණා. දැන් පස් දෙනෙකුට ඉඩ තියෙනවා!"

"බක-හහා, බක-හහහා!" ගාලා කව්දෝ හිනාවුණා.


ඔක්කොම බැලුවාඃ හත්ත උඩ ගෙම්බෙක් ඉඳගෙන හිනා වෙනවා.


"හානේ, උඹ! හත්ත...."

තවත් නොකියා පැන පැන ගියා.

ඔක්කොම හත්ත දිහා බැලුවා. ඊට පස්සෙ අනුමාන කළා මුලින් හත්ත යට තදබදේට තිබුණත් පස්සෙ පස් දෙනෙකුට ඉඩ ඇති වුණෙත් මොකද කියලා.

ඔබ අනුමාන කළා ද?







# "ම්‍යාව්" කීවෙ කවුද?





බලුපැටියා ඇඳ ළඟ පාපිස්ස උඩ නිදාගෙන හිටියා.

උෟට එකපාටරම හීනෙන් ඇහුණා කව්ද "ඤාව්!" කිව්වා. බලු පැටියා ඔළුව උස්සල බැලුවා. කවුරුවත් නෑ.




"බාගවෙලාවට මම හීනයක් දකින්න ඇති" බලුපැටියා හිතලා අයෙමත් හොඳට හරිබරි ගැහිලා නිදා ගත්තා.


ආයෙමත් කව්දෝ "ඤාව්!" කිව්වා."
කව්ද ඒ?"






බලුපැටියා උඩ පැනල නැඟිටල කාමරය පුරාම ඇවිද්දා. ඇඳ යට බැලුවා. මේසෙ යට බැලුවා. කවුරුවත් නෑ!





බලුපැටියා ජනෙල් පඩිය උඩට නැගල බැලුවාම මිදුලෙ කුකුළෙක් ඇවිදිනවා. "මෙන්න මූ තමයි මට නිදාගන්න දුන්නේ නැත්තෙ!" බලුපැටියා මෙහෙම හිතලා කුකුළා ළඟට දිව්වා.





"ඒ උඹද 'ඍ්ාව්' කිව්වෙ" බලුපැටියා කුකුළගෙන් ඇහැව්වා.

"නෑ, මම නොවෙයි.." කුකුළා අත්තටු ගහල "කුක්කු- කුක්-කුක්!" කීවා.

"උඹ වෙන මොකුත් කියන්න දන්නෙ නැද්ද?" බලුපැටියා ඇහැව්වා.

"නෑ, මම 'අඬලනවා' විතරමයි" කුකුළා කිව්වා.





බලුපැටියා පස්සා කකුලෙන් කණ කසලා ගෙදර ගියා...

ආයෙමත් එකපාරට එළිපත්ත ළඟදි කව්දෝ "ක්‍යාච්!" කීවා.

"ඒ මෙතන!" බලුපැටියා තමාටම කියාගෙන එළිපත්ත ළඟ හතර ගාතෙන් හාරන්න පටන් ගත්තා.

ඌ ලොකු වළක් හෑරුවාම වළෙන් එළියට ආවා පුංචි අළුපාට මී පැටියෙක්.





"ඒ උඹද 'ඤාව්' කීවෙ?" බලුපැටියා උගෙන් සැර කරල අහනවා.

"කීස්-කීස්-කීස්" මී පැටියා කෑගැහැව්වා. "කවුද එහෙම කිව්වෙ?"




"කව්දෝ 'ඤාව්' කීවා...."

"ළඟම?" මී පැටියා කලබල වුණා.

"මෙන්න මෙතන, හොඳටම ළඟ" බලුපැටියා කීවා.



"මට බයයි! කීස්-කීස්-කීස්!" මී පැටියා කෑගහලා එළිපත්ත යටට රිංගුවා.



බලුපැටියා හිතන්න පටන් ගත්තා.

ආයෙමත් එකපාරටම බලු කූඩුව ළඟ කවුදෝ හයියෙන් "ඤාව්!" කීවා.

බලු පැටියා තුන් වතාවක් බලු කූඩුව වටේට ගියා. කවුරුවත් හම්බ වුණේ නෑ. ගේ ඇතුළේ කව්දෝ සද්දයක් කළා...

"ඔන්න ඌ තමයි! මම උන්දෑව අල්ල ගන්නම්..." බලු පැටියා තමාටම කියාගෙන කිට්ටු වුණා.





එතකොට ඌට හම්බු උනා ලොකු බූල් බල්ලෙක්.

"ග්ර්-ර්-ර්!" බූල් බල්ලා ගෙරෙව්වා.

"මට... මට දැන ගන්න ඕන..."

"ග්ර්-ර්-ර්-ර්!"



"ඔබද 'ඤාව්' කිව්වෙ?" වලිගෙ බඩ යට ගසාගෙන බලු පැටියා කෙඳුරුවා.


"මම? උඹ බලුපැටියො විහිළු කරනවද!"



බලු පැටියා පුළුවන් තරම් වේගයෙන් උයනට දුවල පඳුරක් යට හැංගුණා. එතනදී උගෙ කණ ළඟම කව්දෝ "ඤාව්!" කිව්වා.




බලු පැටියා පඳුර අස්සෙන් එබිල බැලුවා. ඔහු ඉදිරියේ මලක ලොකු මී මැස්සෙක් ඉඳගෙන ඉන්නවා.



"මෙන්න 'ඤාව්!' කියපු එකා!" බලුපැටියා මෙහෙම හිතලා ඌව දතින් ඩැහැගන්න හැදුවා.

"ෂූ-ෂූ-ෂූ-ෂූ" කේන්ති ගිය මී මැස්සා කෑගහලා බලුපැටියගෙ නහයට ඇන්නා.

බලුපැටියා ගොරවලා දිව්ව. මී මැස්සා ඌ පස්සෙන්!



"අනිනවා! අනිනවා!" මී මැස්සා ඉගිලි ඉගිලි කෑ ගහනවා. බලුපැටියා පොකුණට දුවලා වතුරට පැන්නා!



උෟ ඔලුව දියෙන් උස්සල බැලූ කොට මී මැස්සා නෑ.

එතනදි කව්දෝ ආයෙමත් "ඤාව්!" කිව්වා.

"උඹද 'ඤාව්' කීවෙ?" තමා ළඟින් පීනපු මාළුවෙකුගෙන් බලුපැටියා අහනවා.



මාළුවා මොකුත් කීවේ නෑ. වල්ගය වනල ගැඹුරු දියේ නොපෙනී ගියා.




නෙළුම් කොළයක ඉඳගෙන හිටපු ගෙම්බා "බක-බක-බක!" ගාලා හිනාවෙන්න පටන් ගත්තා. "උඹ දන්නෙ නැද්ද මාළු කතා නොකරන විත්තිය?"

"බාග වෙලාවට උඹ වෙන්නැති 'ඤාව්' ගෑවේ?" බලුපැටියා ඇහුවා.



"බක-බක-බක" ගාලා ගෙම්බා හිනා වෙන්න පටන් ගත්තා. "උඹ වගේ මොට්ටයෙක්, ගෙම්බො බක බක ගානවා විතරයි."

ඌ මෙහෙම කියලා වතුරට පැන්නා.



ඉතින් බලුපැටියා ගෙදර ගියා. උෟ තෙතබරියන් වෙලා. නහය ඉදිමිලා. බොහොම දුකෙන් උෟ ආයෙමත් ඇඳ ළඟ පාපිස්ස උඩ දිගෑරුණා. ඔන්න එතකොටම ඇහුණාඃ

"ඍඥාව්!!!"





ඌ උඩ පැනල නැඟිට්ටා. එතකොට වයිරන් පූසා ජනෙල් පඩිය උඩ ඉඳගෙන ඉන්නවා.



"ඤාව්!" පූසා කිව්වා.


"බුඃ-බුඃ-බුඃ!" බලු පැටියා බුරන්න පටන් ගත්තා. පස්සෙ උඟට මතක් වුණා ලොකු බූල් බල්ලා ගොරවපු හැටි. "ග්ර්-ග්ර්-ග්ර්" උඟ ගොරවන්න පටන් ගත්තා.



පූසා දුන්නක් වගේ පිට වකුටු කරලා "ජ්ස්-ජ්ස්-ජ්ස්!" ගෑවා.



පස්සෙ ඌ "ප්රැස් - ප්රැස්!" ගාලා පිඹල ජනේලයෙන් එළියට පැන්නා.



බලු පැටියා ආයෙමත් පාපිස්ස උඩ වැතුරුණා නිදාගන්න. දැන් ඌ දන්නවා කව්ද "ඤාව්" ගෑවෙ කියල.







මැස්සෙකුයි, ගෙම්බෙකුයි, ඉත්තෑවෙකුයි, කුකුළෙකුයි ගස් කොටයක් උඩ ගෙයක් හදා ගෙන උන්නා.

මැස්සගෙ නම රුංරුං පැංචා. ගෙම්බගෙ නම බක බක අප්පුහාමි. ඉත්තෑවගෙ නම ඉඳිකටු මුදියන්සෙ. කුකුළාගෙ නම හඬලන රාළ.

දවසක් දා මේ හතරදෙනා කැලෑවක් මැදින් ගමනක් ගියා. හතු, මල්, ගෙඩි ජාති, දර එකතු කරන්න. රුංරුං පැංචා යාළුවො තුන් දෙනාගෙ ඔළු උඩින් පියාසර කෙරුවා.




ඉතිං ඔහොම ගිහින්, ගිහින් මේ හතර දෙනාම ගස් කොළං නැති පාළු පිට්ටනියකට ආවා. එතන පුංචි කරත්තයක් තිබෙනවා දැක්කා. කරත්තෙට සවි කරල තිබුණෙ එකට එක නොගැලපෙන රෝද. පළමුවෙනි රෝදෙ බොහොම කුඩා එකක්. දෙවෙනි රෝදෙ තරමක් ලොකුයි. තුන්වෙනි රෝදෙ ඊට ලොකුයි. හතරවෙනි රෝදෙ මහ විසාලයි.

යාලුවො පුදුම වෙලා කරත්තෙ දිහා බලාගෙන ඉන්නකොට, ළඟ තිබුණ පඳුරකින් හාවෙක් එළියට පැන්නා. එයත් කරත්තෙ දිහා බලලා හිනාවෙනවා. හාවාගෙ නම පිනුම් හාමි.

"මේ කරත්තෙ ඔයාගෙ ද?" කියල යාලුවො හතර දෙනා පිනුම් හාමිගෙන් ඇහුවා.

"නෑ. ඒක වලස් හාමිගෙ කරත්තෙ. වලස් හාමි ඔය කරත්තෙ හදන්න බොහොම මහන්සි ගත්තා. නමුත් එයාට ඒක හදල ඉවර කරන්ට බැරි වුණා" කියල පිනුම් හාමි කිව්වා.





"මේ කරත්තෙන් වැඩක් ගන්ට පුළුවන්. ඒ හින්ද අපි මේක ගෙදර ගෙනියමු" කියලා ඉත්තෑහාමි කිව්වා.

"හොඳයි, හොඳයි" කියලා ඒ අදහසට අනිත් යාලුවො තුන්දෙනාම කැමති වුණා.

ඒ හතර දෙනාම එකතු වෙලා කරත්තෙ තල්ලු කරන්න පටන් ගත්තා. රෝද එකට එක ගැලපෙන්නෙ නැති හින්ද කරත්තෙ පොඩ්ඩක්වත් හෙල්ලුනේ නෑ. තල්ලු කළාට මොකද පාර පුරා ගස් මුල්වල හැපී කරත්තෙ ඒ අත මේ අත පෙරළුණා මිසක් ඉදිරියට ගියේ නෑ.

අහකට වෙලා බලාගෙන හිටිය පිනුම් හාමි හති වැටෙන තුරු හිනා වුණා. කරත්තෙ තල්ලු කරපු යාළුවො හතරදෙනාට හොඳටම මහන්සියි.






"අපි එක එක්කෙනා එක එක රෝදය ගෙදර ගෙනියමු" කියලා ඉදිකටු මුදියන්සෙ කිව්වා.

හතරදෙනාම ඒකට කැමති වෙලා එක එක රෝදය ගත්තා. රුංරුං පැංචා ඉතාම කුඩා රෝදය පෙරළන්ට පටන් ගත්තා. ඉදිකටු මුදියන්සෙ ඊළඟ රෝදය පෙරළන්ට පටන් ගත්තා. බක බක අප්පුහාමි තරමක් ලොකු රෝදය පෙරළන්ට පටන් ගත්තා. හඬලන රාළ විශාල රෝදය පෙරළාගෙන ගෙදර ගියා.

"මේ ගොල්ලො හරි පුදුම මිනිස්සු. එකට එක ගැළපෙන්නෙ නැති රෝද ගෙදර ගෙනියනවා" කියලා පිනුම් හාමි කිව්වා. ඊට පස්සෙ පිනුම් හාමි පඳුරු අස්සට පැනලා යන්ට ගියා.



රුංරුං පැංචයි, ඉදිකටු මුදියන්සෙයි, බක බක අප්පුහාමියි, හඬලන රාළයි රෝද හතර ගෙදර ගෙනාවා. රෝදවලින් වැඩක් ගන්නේ කොහොමදැයි කියලා හතර දෙනාම කල්පනා කරන්ට පටන් ගත්තා.



"මම දන්නවා වැඩක් ගන්න හැටි" කියලා රුංරුං පැංචා කිව්වා. එයා ඉතාම කුඩා රෝදයෙන් නූල් කටින යන්තරයක් හදා ගත්තා.



ඉදිකටු මුදියන්සෙ එයා ගෙනා රෝදයට ලී පටි දෙකක් සවි කරගෙන තනි රෝදෙ අත් කරත්තයක් හදා ගත්තා.



"මටත් පුළුවනි මගේ රෝදයෙන් වැඩක් ගන්න" කියලා බක බක අප්පුහාමි කිව්වා. රෝදය ළිඳට උඩින් සවිකරල බක බක අප්පුහාමි ලෙහෙසියෙන් වතුර අදින්ට පටන් ගත්තා.



වේගයෙන් ගලා යන දිය පාරකට අහුවෙලා කැරකැවෙන්න රෝදය සවිකර ගත්තු හඬලන රාළට පුළුවන් වුණා ජල බලයෙන් වැඩ කරන මෝලක් හදා ගන්ට.

මේ විදියට සියලුම රෝදවලින් වැඩ ගන්ට පුළුවන් වුණා.

රුංරුං පැංචා නූල් කටින යන්තරයෙන් නූල් ඇඹරුවා. බක බක අප්පුහාමි ළිඳෙන් වතුර ගෙනැවිත් වත්තෙ එළවළු කොටුවට දැම්මා. ඉඳිකටු මුදියන්සෙ කැලේට ගිහිල්ලා පලතුරු සහ දර කඩාගෙන ඒවා තනි රෝදෙ අත්කරත්තෙ පටවාගෙන ආවා. හඬලන රාළ එයාගෙ මෝලෙ පිටි අඹරන්ට පටන් ගත්තා.




යාළුවො හතර දෙනාගෙ සැපදුක් දැනගන්න දවසක් පිනුම් හාමි ඒ ගොල්ලන්ගෙ ගෙදරට ආවා.

යාළුවො හතර දෙනා පිනුම් හාමි දැකලා බොහොම සන්තෝස වුණා. රුංරුං පැංචා පිනුම් හාමිට අත්මේස් කුට්ටමක් ගොතලා දුන්නා. බක බක අප්පුහාමි ලොකු කැරට් අලයක් දුන්නා. ඉඳිකටු මුදියන්සෙ ඇපල් ගෙඩියක් දුන්නා. හඬලන රාළ රස කැවිලියි පාන් ගෙඩියකුයි දුන්නා.


එදා රෝද ගෙනියනකොට හිනාවෙච්ච නිසා පිනුම් හාමිට ලැජ්ජා හිතුණා.


"මට සමාවෙන්න. රෝද එකට එක ගැළපෙන ඒවා නොවුණත්, ඒවා පාවිච්චි කරන හැටි දන්න අය ඉන්නවනම් වැඩ ගන්න පුළුවන් විත්තිය දැන් මට පේනවා" කියලා පිනුම් හාමි කිව්වා.





# ඔළුව





එකෝමත් එක දවසක මැඩි පැටියෙකුයි, කුකුල් පැටියෙකුයි, මී පැටියෙකුයි, කූඹියෙකුයි, කුරුමිණියෙකුයි ගමනක් ගියා.




මේ අය ගඟ ළඟට අවා.

"අපි නාමු!" මැඩි පැටියා කීවා. කියලා වතුරට පැන්නා.



"අපි පීනන්න දන්නෙ නෑ!" කුකුල් පැටියයි, මී පැටියයි, කූඹියයි, කුරුමිණියයි කීවා.

"උඹලගෙන් ඇති වැඩේ මොකක්ද" කියල මැඩි පැටියා "බක-හහා, බක-හහහා!" ගා හිනාවෙන්න පටන් ගත්තා. ඌ කොතෙක් හිනා වුණා ද කීවොත් වතුර පෙවුනෙ නැතුවා විතරයි.




කුකුල් පැටියටයි, මී පැටියටයි, කූඹියටයි, කුරුමිණියටයි බොහොම හිතට අමාරු වුණා. මේකට මොනව කරන්නද කියල උන් කල්පනා කළා. උන් හිතුවා, හිතුවා, හිතුවා. හිතලා උන් කළේ මෙයයි.




කුකුල් පැටිය ගිහිල්ල කොළයක් අරගෙන ආවා.



මී පැටියා කොට්ටන් ලෙල්ලක් ගෙනාවා.



කුඹියා පිදුරු ගහක් ගෙනවා.



කුරුමිණියා දිග කළු නූල් පොටක් ගෙනාවා.



ඉතින් ඔක්කොම දෙනා එකතු වෙලා වැඩ කරන්න පටන් ගත්තා. පිදුරු ගහ කොට්ටන් ලෙල්ල පතුලෙ ඇලෙව්වා. කොළේ පිදුරු ගහට තියල නූලෙන් බැන්දා. විනාඩියෙන් පදින්න පුළුවන් යස පුංචි ඔරුවක් ඔවුන් හදා ගත්තා.



ඔක්කොම එකතු වෙලා ඔරුව දියත් කරලා...



...ඔරුවට නැගලා ගියා!

මැඩි පැටියා ආයෙමත් හිනාවෙන්න හිතා ගෙන වතුරෙන් මතු වුණා. නමුත් ඔරුව ඈත ගිහිල්ල. මැඩි පැටියට කිට්ටුවෙන්න බැරි තරමට ඔරුව ඈත.





# පොල්ලෙ එළේ





ඉත්තෑවා ගෙදර යමින් හිටියා. ඔහොම යනකොට ඌට හාවෙක් හම්බ වුණා. දෙන්න එක්කම යනවා. කතාව ගමනට ඉනිමගක් නොවැ.

ගෙදරට හුඟාක් ඈතයි. උන් කතා කර කර යනවා.

පාරේ පොල්ලක් තිබුණා.

කතා කර කර යන ගමන් හාවා පොල්ල දැක්කෙ නෑ. ඌ පොල්ලෙ හැපිල නොවැටුණේ යන්තමින්.

"ඕ, උඹ!.." හාවා තරහයෙන් කීවා. ඌ පොල්ලට පයින් ගහපුවාම පොල්ල හුඟක් ඈතට විසි වුණා.

නමුත් ඉත්තෑවා පොල්ල අරගෙන කරේ තබාගෙන දුවල ගියා, හාවා හම්බුවෙන්න.

ඉත්තෑවා පොල්ල ගේනවා දැකලා හාවා පුදුම වුණා.

"මක්කට ද උඹට පොල්ලක්, මොකක්ද ඒකෙන් ඇති වැඩේ ?"


"මේ පොල්ල සාමාන්‍ය එකක් නෙවෙයි. මේක බලය තියන පොල්ලක්" ඉත්තෑවා කීවා.

හාවා 'පුහ්' ගෑවා විතරයි.



උන් ඔහොම ගිහිල්ල ගිහිල්ල දියපාරක් ළඟට ආවා.

හාවා එක පිම්මෙන් දියපාර හරහා පැනල එහා ඉවුරෙ ඉඳල කෑ ගහනවා: "ඔයි, කුරු රාළ, ඔය පොල්ල විසි කරපන් ඔය පොල්ලත් එක්ක උඹට පනින්න බෑ !"





ඉත්තෑවා මුකුත් කිව්වෙ නෑ. ඌ ටික දුරක් පස්සෙන් පස්සට ගිහිල්ලා දුවගෙන දුවගෙන ගිහින් පොල්ල දිය පාර මැද්දෙ ගහල පැන්නා එක් පිම්මෙන්ම එහා ඉවුරට. දැන් ඌ හාවා ළඟින් ඉන්නවා, අමුත්තක් නැතුව වගේ.

හාවා පුදුමයෙන් කටත් ඇරියාඃ

"උඹට අගේට පනින්න පුළුවන් නොවැ!"

"මම පනින්න කොහොමත් දන්නෙ නෑ" ඉත්තෑවා කීවා. " මම පනින කොට මේ පොල්ලෙ බලේ මට පිහිට වුණා."





උන් තවත් දුර ගියා. ඔහොම ටික දුරක් යනකොට මඩ ගොහොරු බිමකට ආවා.

හාවා හෙමින් හෙමින් පැන පැන යනවා. ඉත්තෑවා පස්සෙන් යන ගමන් පොල්ලෙන් පාර සෝදිසි කරනවා.

"ඕයි කුරු රාළ, මොකද උඹ ගාට ගාටා එන්නෙ? බාගදා උඹේ පොල්ල..."

හාවාට මෙය කියල ඉවර කරන්නත් ලැබුණෙ නෑ, ඌ මඩ ගොහොරුවක වැටිල කණ දක්වාම එරුණා. වතුර පෙවෙනවා, ගිලෙන්න යනවා.





ඉත්තෑවා හාවා ළඟට කිට්ටුවෙලා කෑ ගහනවා:

"මේ පොල්ල අල්ල ගනින්! හයියෙන්!"

හාවා පොල්ල අල්ල ගත්තා. ඉත්තෑවා ඈගේ ඇති වීරියෙන් ඇදලා යාළුවව මඩ ගොහොරුවෙන් ගොඩ ගත්තා.

වේලුණු තැනකට ආවාම හාවා ඉත්තෑවාට කියනවා:

"ඉත්තෑ හාමි උඹට ස්තුතියි, උඹ මාව බේරාගත්තා."


"උඹ මේ මොනව කියනව ද! ඒක පොල්ලෙ බලේ, අමාරුවකදි පිහිට වෙනවා."




උන් තවත් දුර ගියා. ඔහොම යනකොට අඳුරු කැලේ එළිමහන් බිමේ කුරුළු පැටියෙක් වැටිල ඉන්නවා දැක්කා. කුරුළු පැටියා කුරුළු කූඩුවෙන් වැටිලා. ඌ දුකින් කෑ ගහනවා. කුරුළු මව්පියෝ ඌට ඉහළින් ඉගිල්ලෙනවා. මොනව කරන්නද කියල දන්නෙ නෑ.

"පිහිට වෙයල්ලා, පිහිට වෙයල්ලා!" උන් කෑ ගහනවා.

කුරුළු කූඩුව තියෙන්නෙ උඩ. කොහොමටවත් කිට්ටුවෙන්න බෑ. හාවාත්, ඉත්තෑවාත් ගස් බඩ ගාන්න දන්නෙ නෑ. නමුත් පිහිට වෙන්න ඕනෑ.







ඉත්තෑවා හිතල, හිතල තීරණයකට ආවා. "ගහට හේත්තු වෙලා හිට ගනින්!" ඉත්තෑවා හාවාට අණ කළා.



හාවා ගහට හේත්තු වෙලා හිටගත්තා. ඉත්තෑවා කුරුළු පැටියව පොල්ලෙ කෙරවල ඉන්දවල, හාවගෙ කර උඩ නැඟල පොල්ල දික් කළා කුරුළු කූඩුව ළඟටම.

කුරුළු පැටියා තවත් වරක් කෑ ගහල එකපාරටම කුරුළු කූඩුවට පැන්නා.

කුරුළු අම්මටයි, තාත්තටයි හරි සන්තෝසයි. හාවයි ඉත්තෑවයි වටේ ඉගිලි ඉගිලි කෑ ගහනවාඃ

"ස්තුතියි, ස්තුතියි, ස්තුතියි!"

හාවා ඉත්තෑවට කියනවාඃ

"ඉත්තෑ හාමි උඹ හරි හපනෙක්! උඹ අගේට හිතුවා!"

"උඹ මේ මොනව කියනවද! ඒක මේ පොල්ලෙ බලේ, ඉහළ නගින්නත් පුළුවන්!"

උන් කැලේට ආවා. දුර යන්න යන්න කැලේ ගනයි, අන්දකාරයි. හාවා බයයි. නමුත් ඉත්තෑවට ගානක්වත් නෑ. ඉස්සරහින් යනවා. පොල්ලෙන් අතු එහාට මෙහාට කරනවා.

ඔන්න එක පාරටම ගහක් පිටුපසින් මහා වෘකයෙක් පැනල පාර අවහිර කරල ගොරවනවා:

"හිටපියව්!"

හාවා ඉත්තෑවත් එක්ක නතර වුණා.

වෘකය තොල කට ලෙවකාලා දත්මිටි කාලා කියනවා:

"ඉත්තෑවෝ, මම උඹට අත තියන්නෙ නෑ. උඹේ කූරු තියෙනවා. නමුත් වපරයා, උඹව මම එහෙම පිටින්ම, කණයි වල්ගෙයි ඔක්කොම එක්ක කනවා!"





හාවා බයෙන් වෙව්ලුවා. සීත කාලෙදි වගේ සුදුමැලි වුණා. දුවන්න බෑ. කකුල් පොළොවට ඇලිලා. හාවා ඇස් පියා ගත්තා. දැන් වෘකයා කනවා.


ඉත්තෑවා විතරක් බය වුණේ නෑ. ඉත්තෑවා පොල්ල වනලා ඇගේ ඇති වීරියෙන් වෘකයගෙ කොන්දට පාරක් දුන්නා.

වෘකයා වේදනාවෙන් කෑගහල උඩපැනලා දුවන්න පටන් ගත්තා.

ඉතින් වෘකයා එකපාරක්වත් පස්ස නොබලා දිව්වා.

"ඉත්තෑවො උඹට ස්තුතියි, උඹ මේ පාර මාව වෘකයගෙන් බේරා ගත්තා!"

"ඒක මේ පොල්ලෙ බලේ, හතුරට බැටේ දෙනවා" ඉත්තෑවා කීවා.





දෙන්නා ඔහොම තවත් දුර ගියා. කැලෙන් ගිහිල්ලා පාරකට වැටුණා. පාර බොහොම අමාරුයි. කඳු පාරක්.

ඉත්තෑවා පොල්ල උපකාර කරගෙන ඉස්සරහින් යනවා. අසරණ හාවා පහුවෙලා, මහන්සියෙන් නොවැටෙන එක විතරයි.

ගෙදරට හුඟක් කිට්ටුයි. හාවාට තවත් දුර යන්න බෑ.

"කමක් නෑ, මේ පොල්ල අල්ල ගනින්" ඉත්තෑවා කීවා.

හාවා පොල්ල අල්ලගත්තා. ඉත්තෑවා ඔහුව කඳු මුදුනට අරන් යනවා. ගමන පහසු වගේ හාවාට දැනුණා.

"බලපන්කො උඹේ පොල්ල මට ආයෙත් සැරයක් පිහිට වුණානේ." හාවා ඉත්තෑවට කියනවා.

ඉතින් ඔහොමයි ඉත්තෑවා හාවාව ගෙදර අරගෙන ගියේ. හා බිරිඳයි, හා දරුවොයි හුඟාක් වෙලා ඉඳල මග බල බල ඉන්නවා.

ඔක්කොටම සන්තෝසයි. හාවා ඉත්තෑවාට කියනවාඃ

"උඹේ ඔය පුදුම පොල්ලෙ බලේ නැත්නං මට ගෙදර එන්න හම්බු වෙන්නෙ නෑ."

එතකොට ඉත්තෑවා හිනා වෙලා කියනවාඃ

"මේ පොල්ල මගෙන් තෑග්ගක් හැටියට ගනින්. බාගවෙලාවට උඹට ආයෙත් පිහිට වෙන්න පුළුවන්."

හාවා පුදුම වුණා.

"උඹ කොහොමද මේ පුදුම පොල්ලෙ බලේ නැතුව ඉන්නෙ?"

"කමක් නෑ, පොල්ලක් ඕන වෙලාවක හොයා ගන්න ඇහැකි. නමුත් බලේ" ඉත්තෑවා තම ඔළුවට තට්ටු කරල කියනවා"බලේ මෙන්න මෙතනයි!"

හාවාට ඔක්කොම යසට තේරුණා.

"උඹ කිව්ව එක හරි. පොල්ල නෙවෙයි වැදගත්. නුවණ ඇති ඔළුවත්, කරුණාවන්ත හදවතත්!"





# ඇපල් ගෙඩිය



සරත් සමය අවසාන වීගෙන එනවා. දැනටම ගස්වල කොළ හැලිලා. කැලේ ඇපල් ගහක එකම එක ඇපල් ගෙඩියක් විතරක් ඉතුරු වෙලා තියෙනවා.



මේ සරත් සමයෙ කැලේ දුවන හාවෙක් දැක්කා මේ ඇපල් ගෙඩිය.



කොහොමද මේක කඩාගෙන්නෙ? ඇපල් ගෙඩිය හුඟාක් උඩ. උඩපනින්න බෑ!

"කාක්-කාක්!"

හාවා බැලුවා. බැලින්නම් ගහක් උඩ කාක්කෙක් ඉඳගෙන හිනා වෙනවා.

"ඕයි, කාක්කො! මට ඔය ඇපල් ගෙඩිය කඩල දීපන්!" හාවා කෑ ගහනවා.

කාක්කා ඇපල් ගහට පියඹලා ඇපල් ගෙඩිය කෑඩුවා. නමුත් ඇපල් ගෙඩිය හොටෙන් ගිලිහිලා බිමට වැටුණා.





"කාක්කො, උඹට ස්තුතියි!" හාවා මෙහෙම කියලා ඇපල් ගෙඩිය ගන්න හදන කොටම පණ ඇති එකෙක් වගේ ඇපල් ගෙඩිය 'ෂ්' ගාලා දුවන්න පටන් ගත්තා.

මේ මොකද?

හාවා බය වුණා. නමුත් පසුව වෙච්ච දේ තේරුණා. ඇපල් ගෙඩිය වැටුණෙ ඇපල් ගහ යට නිදාගෙන හිටිය ඉත්තෑවකුගෙ පිට උඩ. ඉත්තෑවා උඩ පැනල දුවන්න පටන් ගත්තා. ඇපල් ගෙඩිය ඉත්තෑ කූරුවල ඇනිලා.

"හිටපන්, හිටපන්! කොයිද මගෙ ඇපල් ගෙඩිය ගෙනියන්නෙ?" හාවා කෑගහනවා.



ඉත්තෑවා නතරවෙලා, කියනවාඃ

"මේක මගෙ ඇපල් ගෙඩිය. ඒක වැටුණා, මම ඒක අල්ලා ගත්තා." හාවා ඉත්තෑවා ළඟට ගිහිල්ලා කියනවාඃ

"දුන්ම දීපන් මගෙ ඇපල් ගෙඩිය! ඒක මමයි හොයා ගත්තෙ!" එතකොට කාක්කා ඔවුන් ළඟට ඉගිල්ලිලා ආවා.

"සණ්ඩු කරන්න වැඩක් නෑ, ඒක මගෙ ඇපල් ගෙඩිය. ඒක මම කඩා ගත්තා."

එකෙකුටවත් බෑ එකඟතාවයකට එන්න. හැම එකෙක්ම කෑගහනවාඃ "මගෙ ඇපල් ගෙඩිය!" කියල.

මුළු කැලේ පුරාම කෑ ගැසීම්, හඬගෑම්. ගුටිබැටත් පටන් අරගෙනඃ කාක්කා ඉත්තෑවගෙ නහයට කෙටුවා, ඉත්තෑවා හාවාට කූරුවලින් ඇන්නා, හාවා කාක්කාට පයින් ගැහැව්වා...





ඔන්න එතකොට මෙතනට වලහෙක් ආවා. වලහා ගොරවනවාඃ

"මොකොද මේ? මොකක්ද මේ සද්දෙ?"

එතකොට ඔක්කොම ඔහුට කියනවාඃ

"අනේ, වලස් හාමි, උඹ තමයි මේ කැලේ ඉන්න ලොකුම එක්කෙනා, මහම නුවණක්කාරයා. අපට යුක්තිය ඉෂ්ට කරල දෙන්න. මේ ඇපල් ගෙඩිය අයිති කාටද කියල කියන්න."

ඉතින් උන් වලහට ඔක්කොම වෙච්ච දේ කීවා.



වලහා හිතුවා, හිතුවා.
පස්සෙ කණ කසල
අහනවාඃ

"කවුද ඇපල් ගෙඩිය
හොයා ගත්තෙ?"
"මම!" හාවා කීවා.

"කවුද ඇපල් ගෙඩිය කඩා
ගත්තෙ?"
"කඩාගත්තෙ මමයි!"
කාක්කා කෑ ගැහුවා.

"හොඳයි. ඉතින් කවුද ඒක
අල්ල ගත්තෙ?"
"මම අල්ලගත්තෙ!"
ඉත්තෑවා කීවා.



"ඔන්න, උඹල ඔක්කොම හරි. ඒ හින්දා උඹල හැම එක්කෙනෙකුටම ඇපල් ගෙඩිය අයිති වෙන්න ඕන..."

"නමුත් මෙතන එක ඇපල් ගෙඩියක් විතරයි නොවැ තියෙන්න!" ඉත්තෑවයි හාවයි කාක්කයි කීවා.

"මේ ඇපල් ගෙඩිය සමාන කොටස්වලට බෙදන්න. හැම එක්කෙනකුටම කෑල්ලක් කන්න ඇහැකි."

එතකොට ඔක්කොම එකට කෑ ගැහුවාඃ

"අපි මේක කලින් නො හිතපු හැටි!"



ඉත්තෑවා ඇපල් ගෙඩිය අරගෙන එය හතරට බෙදුවා.

එක් කෑල්ලක් හාවාට දීලා කියනවාː

"හාවො මේක උඹට. උඹයි ඉස්සරවෙලාම ඇපල් ගෙඩිය දැක්කෙ."

දෙවැනි පංගුව කාක්කාට දීලා කියනවාː

"කාක්කො, මේක උඹට. උඹයි ඇපල් ගෙඩිය කඩාගත්තෙ."

තුන්වැනි පංගුව ඉත්තෑවා කටේ ඔබාගෙන කියනවාː

"මේක මටයි, මමයි ඇපල් ගෙඩිය අල්ලගත්තෙ."

හතරවැනි පංගුව ඉත්තෑවා වලහගෙ අතට දුන්නා.

"මේක උඹටයි, වලස් හාමි..."

"මට මක්කට ද?" වලහා පුදුම වුණා.

"උඹ අපිව සමගි කරපු හින්ද. අපට නුවණ කියල දීපු හින්ද!"

ඉතින් ඔක්කොම දෙනා බොහොම සතුටින් තමුන්ගෙ ඇපල් පංගු කෑවා. ඒ මොකද, වලහ කාවත් තරහ නොකර යුක්තිය ඉෂ්ට කරපු නිසයි.






මීයා
හා
පැන්සලය



චෝචාට පැන්සලයක් තිබුණා. ඔහු පැන්සලේට බොහොම ආදරෙයි. චෝචා රූප ඇඳීමට බොහොම ආසා ඇති ළමයෙක්. චෝචාට වුවමනා රූප ඔහුගේ පැන්සලය බොහොම හොඳින් අඳිනවා.




රෑ චෝචා නිදා හිටියා. එතකොට කෑම හොයා ගිය කුඩා මීයෙක් චෝචාගේ මේසයට නැංගා. එහි චෝචාගේ පැන්සලය තිබෙනවා මීයා දැක්කා. "මේක මට හොඳයි" කියලා පැන්සලය ඩැහැගෙන මීයා ගුලට වැදුනා.



“අනේ මා අතඅරින්න! මගෙන් ඔබට ඇති වැඩේ මොකක් ද? මම ලී කෑල්ලක්, කෑමක් නොවෙයි” පැන්සලය මීයාට කන්නලව් කරන්නට පටන් ගත්තා.


“මගේ දත් උල් කරගන්න මොනව හරි නිතර හපන්න ඕනෑ. දැන් මට උඹ හපා කන්න පුළුවනි. මෙන්න හපා කනවා” කියල මීයා පැන්සලය තදින් හැපුවා.






“අනේ මට හිරිහැර කරන්න එපා! මට තව එකම එක රූපයක් අඳින්න ඉඩ දෙන්න. ඊට පස්සෙ ඔබට ඕනෑ දෙයක් කරන්න” පැන්සලය මෙසේ කන්නලව් කළා.

“හොඳයි උඹට ඕනෑ දෙයක් ඇඳපන්. ඊට පස්සෙ උඹ කුඩා කෑලිවලට හපකරල දානවා” මීයා පිළිතුරු දුන්නා.



කනගාටුවෙන් සුසුම් හෙළලා පැන්සලය ලොකු රවුමක් ඇන්දා. එවිට මීයා ඇහුවා "මේක කේජු බෝලයක් ද? කියල.


"හොඳයි! එහෙම හිතා ගනිමුකො" කියල පැන්සලය ලොකු රවුම ඇතුළේ කුඩා රවුම් තුනක් ඇන්දා.



"හා! හා! කේජු බෝලයක් ම තමයි. අන්න කේජු බෝලෙ හිල්!" මීයා කිව්වා.


"හොඳයි ඒවාට කේජු බෝලේ හිල්ය කියමුකො!" පැන්සල මෙහෙම කියල පළමු රවුමට පහළින් තවත් රවුමක් ඇන්දා.

"මේක ඇපල් ගෙඩියක් නේ ද?" මීයා ඇහුවා.




"හොඳයි ඒක ඇපල් ගෙඩියක් තමයි," කියල දෙවනි ලොකු රවුම ළඟින් දිග හැඩේ යමක් අඳින්න පටන් ගත්තා.


"හා! හා! මම දන්නවා, මේවා කෙසෙල් ගෙඩිනේ! දකිනකොටම කන්න හිතෙනවා" මීයා කිව්වා.



පැන්සලය පළමු රවුමට ඉහළින් කුඩා මුළු දෙකක් අඳින්න පටන් ගත්තා. "අපොයි! අපොයි! දන්නම් බළලෙක් වගෙයි. ඔය ඇති! ඔය ඇති! නවත්වාපන්" මීයා කෑ ගැහුවා.





නමුත් පැන්සලය ඉහළ රවුමේ දිග රැවුල් ගසුත් කටකුත් ඇන්දා.



"මූ නම් බළලෙක් ම තමයි! මාව බේරා ගනිල්ලා!"යි කෑ ගහලා මීයා පණ බයේ පැන දිව්වා.


මීයා දුවලා තම ගුලට වැදුනා. ඊට පස්සේ හිස එයින් පිටතට දැම්මේ නෑ.





පැන්සලය තවම වෝවා ළඟ ය. දැන් එය පැන්සල් කොටයකි.

මීයන් බිය ගැන්වීමට හැකි බළලෙක් ඇඳීමට දැන් ඔබටත් පුළුවන්දැයි බලන්න.







කුකුළා
හා
පාට




චෝවා කුකුළෙකුගේ රූපයක් ඇන්දා. නමුත් ඔහුට එය පාට කිරීමට අමතක වුණා.

දවසක් කුකුළා ගමනක් ගියා. එවිට කුකුළාට බල්ලෙක් හමු වුණා. "බලන්න උඹේ හැටි! පාට කර නැහැ නොවැ!" යි බල්ලා කිව්වා.




කුකුළා පොකුණක් ළඟට ගියා. එහි තම ඡායාව දෙස එබී බැලුවා. "බල්ලා කිව් දේ සැබෑ තමයි" කුකුළා තමාටම කියා ගත්තා.




“කනගාටු වෙන්න එපා! සායම්වලින් ඔබට උදව් ලබා ගන්න පුළුවනි. ඒවා සොයා යන්නැ” යි බල්ලා කුකුළාට උපදෙස් දුන්නා.




කුකුළා සායම් සොයා ගොස් “කරුණාකර මා පාට කරන්නැ”යි ඉල්ලා සිටියා.




රතු පාට ඊට කැමති වී කුකුළාගේ උඩු කරමළත් යටි කරමළත් හොඳටම රතු වන තුරු පාට කළා.



නිල් පාට ද වලිගයේ පිහාටු සියල්ල ම නිල් පාට කළා.



කොළ පාට, අත්තටු සායම් කළා.



කහපාට, බෙල්ල හා පපුව සායම් කළා.




"ආ! උඹ දැන් නම් නියම කුකුළෙක්" ඊට පසු බල්ලා කිව්වා.



මේ කුකුළා පාට කරන්න. කුකුළ පැටියා කහපාට කරන්නට මතක තබා ගන්න.





දහකාර
පුසා




පුංචි ගෑනු ළමයා මේසය ළඟ වාඩි වී පින්තූර අඳිනවා.

වයිරන් පූසා පුටු ඇන්දට පැනල ඇය අඳින දිහා බලා ගෙන ඉන්න වුණා.




"මොනවද ඔයා කරන්නේ?" පූසා විපරම්කාරීව ඇහුවා.

"මම උඹට ගෙයක් අඳිනවා." පුංචි ගෑනු ළමයා කීවා. "බලන්න මේ වහල, මේ දුම් කවුළුව, මේ තමා දොර...."

"ඉතින් මම මොනවද ගෙදර කරන්නෙ?"

"උඹට පුළුවන් බත් උයන්න."








පුංචි ගෑනු ළමයා දුම් කවුළුවෙන් දුම් පිට වෙනවා ඇන්දා.


"ඉතින් කෝ ජනේල?" පූසා ඇහුවා. "ඔයා දන්නවනේ, පූසො හැම තිස්සෙම ජනේලවලින් පැනල යන්නෙ!"



“මෙන්න තියෙනවා - එකයි, දෙකයි, තුනයි, හතරයි...” ඈ ඇන්දා කුඩා ජනේල හතරක්.

“ඉතින් මට ඇවිදින්න තැනක් හෙම තියෙනව ද?”





"මෙන්න තියෙනවා"


පුංචි ගෑනු ළමයා ඇන්දා ගේ වටේට වැටක්.

"ඒක උයන" ඇ කිව්වා.

පූසා ඉව කළා

"අපෝ ඒක උයනක් යැ?" ඇ කීවා. "ඒකෙ මොකුත් නෑ නේ!"








"පොඩියක් ඉඳින් පූසො" පුංචි ගෑනු ළමයා කීවා. "මෙන්න උඹට මල් පාත්තියක් තියෙනවා. මෙන්න ඇපලුත් එක්ක ඇපල් ගහක්. තව එළවළු කොටුවක්, ඒකෙ කැරට්ටුයි ගෝවයි තියෙනවා..."


"ගෝවා!" නහය හකුළමින් පූසා කීවා. "ඉතින් මම කොහෙන් ද මාළු අල්ලන්නෙ?"



"මෙන්න තියෙනවා"

පුංචි ගෑනු ළමයා පොකුණක් ඇන්දා. පස්සෙ පොකුණෙ මාළු පීනනව ඇන්දා.

"ඒක අපූරුයි... ඉතින් කුරුල්ලො හෙම නැද්ද?" පූසා විපරම්කාරීව ඇහුවා. "මම කුරුල්ලන්ට ආදරයි"






"ආ, ඔව්. මෙන්න කුකුළෙකුයි, කිකිළියෙකුයි. මෙන්න පාත්තයෙක්. තව කුකුල් පැටව් තුන් දෙනෙක්..."

පූසා හකුපාඩා ලෙවකාලා පුරු පුරු ගෑවා. පස්සෙ හීන් හඬකින් අහනවා මෙහෙම:

"ඉතින්.... ගෙදර මීයො එහෙම නැද්ද."

"නෑ. මීයො ඕන නෑ ගෙදරට"

"ඉතින් කවුද මගේ ගේ බලා කියා ගන්නෙ?"







"එය බලා කියා ගන්න...." පුංචි ගෑනු ළමයා බලු කූඩුවක් ඇන්දා. "මෙන්න උඹේ මුරකාරයා, එයාගෙ නම රෝවර්!"

පූසා වල්ගය නැටෙව්වා, උගේ මයිල් කෙළින් හිටියා.

"මම ඔයාගෙ ගෙට පොඩියක්වත් කැමති නෑ. මම ඒකෙ ඉන්න කැමති නෑ!" පූසා කීවා.

එහෙම කියල ඌ කේන්තියෙන් යන්න ගියා.

ඌ දඟකාර පූසෙක් නේ ද?






නත්තල් ගහ




පොඩිත්තො අද උදේ කැලැන්ඩරය දිහා බැලුවා. ඉතුරු වෙලා තියෙන්නෙ අන්තිම කොළයයි.

හෙට අලුත් අවුරුද්ද! හෙට නත්තල් ගහට! සෙල්ලම් බඩු ලැබේවි. නත්තල් ගහක් නෑ. හුඟාක් ලස්සන නත්තල් ගහක් ගන කැලෑවෙන් එවන්න කියල පොඩිත්තො නත්තල් සීයට ලියුමක් ලියන්න තීරණය කළා.






ඉතින් පොඩීත්තො මේ විදියට ලියුමක් ලියල හනික මිදුලට දිව්වා, හිම බබා අඹන්න.








ඔක්කොම එකට එකතුවෙලා වැඩ කළා. කෙනෙක් හිම ගොඩ ගැහුවා. තව කෙනෙක් හිම බෝල හද හද තිබ්බා...

හිම බබාගෙ ඔලුවට පරණ බාල්දියක් ඇන්දෙව්වා. ඇස්වලට ගල් අගුරු කැලි තිබ්බා. නහයට කැරට් අලයක් තිබ්බා.

දැන් හිම තැපැල් කරුවා අපූරුයි!





පොඩිත්තො ඔහුට ලියුම දීලා මෙහෙම කියනවාඃ

හිම බබෝ, හිම බබෝ,
එඩි ගති ඇති හිම බබෝ,
අඳුරු කැලයට වැදියන්
ලියුම අරගෙන පලයන්

නත්තල් සීයා ලියුම ලබයි
කැලේ නත්තල් ගහක් සොයයි
උල් කොළ ඇති, බොහො කොළ ඇති
නත්තල් ගහ රුවට රුවැති.

ඒ නත්තල් ගහ හනිකට
ගෙනත් දෙන්න පොඩිත්තන්ට!



හවස් වුණා. පොඩිත්තො ගෙදර ගියා. හිම බබා කියනවාඃ "මට වැඩක් බාර දුන්නා! දැන් මම කොහාට යන්නද?"




"උඹ එක්ක මාවත් අරන් පලයන්. මම පාර හොයන්න උදව් වෙන්නම්" එකපාරටම රෝවර් බලුපැටියා කීවා.



"ඇත්ත තමයි, දෙන්නෙක් එක්ක යන්න විනෝදයි! ලියුමත් එක්ක මාව පරිස්සම් කරපන්, පාර මතක් කරල දීපන්" හිම බබා සතුටින් කීවා.



හිම බබයි, රෝවර් බලු පැටියයි හුඟාක් දුර ගිහින් ගිහින් ලොකු ගන කැලෑවකට ආවා...



එතකොට ඔවුන් ඉදිරියට හාවෙක් දුවගෙන එනවා.

"කොහෙද නත්තල් සීයා ඉන්නෙ?" හිම බබා හාවාගෙන් ඇහුවා. හාවාට උත්තර දෙන්න වෙලාවක් නෑ: ඌ පස්සෙන් නරියෙක් එළවනවා.



රෝවර් "බුඃ-බුඃ" ගාලා හාවා පස්සෙන් එළවන්න පටන් ගත්තා.



හිම බබාට දුකයි. "බාග වෙලාවට, මට ඉතින් තනියම යන්න වේවි."



හිම කුනාටුවක් පටන් ගත්තා. හිම කුනාටුව මහ හඬින් වැළපෙමින් හමාගෙන යනවා.



හිම බබා හෙළවුණා, හෙළවුණා.... පස්සෙ ඉහිරිලා ගියා. බාල්දියත්, ලියුමත්, කැරට් අලයත් විතරයි, හිම ගොඩේ ඉතිරි වුණේ.



නරියා ආපහු ඇවිල්ලා කේන්තියෙන් අහනවාඃ

"කවුද මට බාදා කෙරුවෙ, හාවා අල්ලගන්න?"

බැලුවාඃ කවුරුත් නෑ. හිම උඩ ලියුමක් විතරක් තියෙනවා. නරියා ලියුම අරගෙන දුවන්න පටන් ගත්තා.



රෝවර් බලු පැටියා ආපහු ඇවිදින් අහනවා: "කොහෙද හිම බබා?"

හිම බබා නෑ.

මේ අතර වෘකයා නරියා පස්සෙන් එළවනවා.

"යාළුවේ, උඹ මොනවද ගෙනියන්නෙ, අපි දෙන්නා බෙදා ගමු!" වෘකයා කෑ ගහනවා.

"මට බෑ බෙදන්න, ඒක මටම ඕන" කියල නරියා දුවනවා.

වෘකයා ඌ පස්සෙන් දුවනවා.





විපරම්කාර පොල්කිච්චෙක් උන් එක්ක ඉගිල්ලෙනවා.



රෝවර් බලුපැටියා අඬනවා. හාවො උෟට කියනවාඃ

"උඹට ඔහොම වෙලා මදි. අපව එළවන්න එපා, අපව බය කරන්න එපා!"



"මම එළවන්නෙත් නෑ, බය කරන්නෙත් නෑ" කියල රෝවර් තවත් හයියෙන් අඬනවා.



"අඬන්න එපා, අපි උඹට උදව් වෙන්නම්" හාවො කීවා.

"අපි හාවන්ට උදව් වෙන්නම්" ලේන්නු කීවා.



හාවො හිම බබා අඹන්න පටන් ගත්තා. ලේන්නු උන්ට උදව් කළා: උන් අත්වලින් හිම ගුලි හදනවා, වල්ගවලින් හිම ගානවා.

ආයෙත් ඔළුවට බාල්දිය ඇන්දෙව්වා. ඇස්වලට ගල් අඟුරු කෑලි තිබ්බා. නහය වෙනුවට කැරට් අලයක් තිබ්බා.

"ස්තුතියි, උඹලට. ආයෙමත් මාව ඇඹුවා. දැන් ඉතින් මට උදව් කරපල්ලා නත්තල් සීයා හොයන්න."



ඔහුව වලහා ළඟට ඇරියා. වලහා ගුහාවට වෙලා නිදි. ඌව ඇහැරෙව්වෙ අමාරුවෙන්.

නත්තල් සීයාට ලියුමක් දෙන්න පොඩිත්තන් තමා එවපු බව හිම බබා වලහාට කීවා.

"ලියුමක්?" වලහා ගෙරෙව්වා. "කොහෙද ඒක?"

"උදුරාගත්තා - ලියුම නෑ"







"ලියුම නැතුව උඹට නත්තල් සීය නත්තල් ගහක් දෙන්නෙ නෑ. ආපහු ගෙදර යන එක හොඳයි. මම උඹව කැලෙන් එහාට ඇරලන්නම්" වලහා කීවා.

ඔන්න එකපාරටම පොල්කිච්චා කොහෙන්දෝ පියාඹාගෙන් ඇවිල්ලා කෑගහනවා.

"මෙන්න ලියුම, මෙන්න ලියුම!"

පොල්කිච්චා කීවා ලියුම හොයා ගත්තු හැටි.




ඉතින් ඔක්කොම හරි.

ඔක්කොම දෙනා ලියුමත් අරගෙන නත්තල් සීය ළඟට යනවා.





හිම බබා ඉක්මන් වෙනවා, කලබල වෙනවා, කඳුවලින් රූටා යනවා, වලවල්වල වැටෙනවා, කොටන්වල හැපෙනවා.



වලහා හිම බබාට උදව් කරපු එක හොඳට ගියා. නැත්තං ආයෙමත් හිම බබා ඉහිරිලා යන්න තිබුණා.

අන්තිමේදි ඔවුන් නත්තල් සීයා ළඟට ආවා.

නත්තල් සීයා ලියුම කියවල කියනවාඃ

"මොකෝ මෙච්චර පරක්කු වෙලා? හිම බබා, පොඩිත්තන්ට අලුත් අවුරුද්දට නත්තල් ගහක් ගෙනිහින් දෙන්න උඹට ලැබෙන්නෙ නෑ."






මෙහිදී ඔක්කොම දෙනා හිම බබා වෙනුවෙන් කතා කරන්න පටන් ගත්තා. කිව්වා, හිම බබාට වෙච්ච දේ. ඉතින් නත්තල් සීයා හිම බබාට තමන්ගෙ හිම යානය දීලා ඔහුව වේගයෙන් නත්තල් ගහත් එක්ක පොඩිත්තන් ළඟට යැව්වා.



වලහා ගෙදර ගියා, වසන්ත සමය එනකල් නිදා ගන්න.



හිම බබා පුරුදු තැන හිටගෙන ඉන්නවා. ලියුම තිබුණු ඔහුගෙ අතේ දැන් තියෙනවා නත්තල් ගහක්.



# මොකාද



# මේ කුරුල්ලා?



ඔන්න එකෝමත් එක රටක පාත්තයෙක් හිටියා. මේ පාත්තයා හරිම මෝඩයි, ඉරිසියයි.

හැම කෙනාටම ඉරිසියා කරනවා. හැම කෙනා එක්කම රණ්ඩු කරගන්නවා. හැම කෙනාටම කොටනවා. ඉතින් ඔක්කෝම කියනවා "අපෝ, මෙහෙම පාත්තයෙක්!" කියල.




දවසක් පාත්තයා දැක්කා පොකුණෙ හංසයෙක් ඉන්නවා. හංසයගෙ දිග බෙල්ලට පාත්තයාට ආසා හිතුණා.

"මටත් මේ වගේ බෙල්ලක් ඇත්නම්!" කියලා පාත්තයා හිතුවා.

පාත්තයා හංසයට කිව්වා "අපි බෙලි මාරු කර ගනිමු. උඹේ බෙල්ල මට දීපන්, මගේ බෙල්ල උඹට දෙන්නං" කියලා.

හංසයා ටිකක් වෙලා හිතලා ඒකට කැමති වුණා. ඉතින් දෙන්නා බෙලි දෙක මාරු කර ගත්තා.



පාත්තයා හංසයගෙ දිග බෙල්ලත් අරගෙන යනවා. ඒකෙන් මොනව කරන්නද කියල දන්නෙ නෑ. බෙල්ල ඇඹරුවා, කෙළින් කරා, රවුන් කළා. ඒ කොහොම කළත් පහසුවක් නෑ.

කරවැල් කොකෙක් පාත්තයා දැකලා හිනාවෙනවා. "උඹ පාත්තයෙකුත් නෙවි හංසයෙකුත් නෙවි! හඃ හඃ හා!"

පාත්තයාට කේන්ති ගියා. කොටන්න හිතුණා. එතකොටම දැක්කා කරවැල් කොකාගෙ සාක්කුවක් වගේ තියෙන හොට.

"මටත් මේ වගේ හොටක් ඇත්නම්" පාත්තයා මෙහෙම හිතල කරවැල් කොකාට කියනවා.

"අපි හොටවල් මාරු කර ගනිමු. මගෙ රතුපාට හොට උඹට දෙන්නං, උඹේ ඔය සාක්කු හොට මට දීපන්."



කරවැල් කොකා හිනා වුණා. නමුත් ඒකට එකඟ වුණා. ඉතින් දෙන්නා හොටවල් මාරු කර ගත්තා.



මේ මාරු කිරීම් පාත්තයගෙ හිතට බොහොම ඇල්ලුවා.

පාත්තයා මාන කොකා එක්ක කකුල් මාරු කර ගත්තා. තමන්ගෙ දෑල් සහිත කකුල් වෙනුවට මාන කොකාගෙ දිග කකුල් ලැබුණා.




තමන්ගෙ ලොකු සුදු තටු කාක්කාට දීලා, කාක්කගෙ පුංචි කළු තටු ගත්තා.

තමන්ගෙ කොට වල්ගය දීලා මොණරගෙ ලස්සන පිල් ලබා ගන්න පාත්තයා හුඟ වේලාවක් පෙරැත්ත කළා. අන්තිමේ දී ඒකෙනුත් ජය ගත්තා.



කරුණාවන්ත කුකුළා තමන්ගෙ කරමලත්, තැල්ලත්, "කුක්කු කූ" යන හඬත් පාත්තයාට තෑගි කෙරුවා.

දැන් පාත්තයා කා වගේවත් නෙවෙයි.






උෟ කොක් කකුල්වලින් මිදුලෙ ඇවිදිනවා, ඉවක් බවක් නැතුව කපුටු තටුවලින් තටු ගහනවා, හංසයගෙ බෙල්ල එහාට මෙහාට අඹරවනවා.

පාත්තයෝ රංචුවක් උෟට මුණ ගැහුණා.

"ගා - ගා - ගා, මොකාද මේ කුරුල්ලා?" පාත්තයෝ පුදුම වුණා.



"මම පාත්තයෙක්!" පාත්තයා කපුටු තටු ගහලා හංස බෙල්ල කෙළින් කරලා බෙරිහන් දුන්නා. කරවැල් කොකාගෙ සාක්කු හොට හොඳමට ඇරල කුක්කු-කූ කීවා! "මම ඔක්කෝටම වැඩිය හොඳයි!"

"ඉතින් උඹ පාත්තයෙක් නම් යමු අපිත් එක්ක" පාත්තයෝ කීවා.

පාත්තයෝ තණ පිට්ටනියකට ගියා. මේ පාත්තයත් උන් එක්ක ගියා.

ඔක්කොම පාත්තයෝ තණකොළ කඩනවා. මේ පාත්තයාට කරන්න පුළුවන් ලොකු හොටින් තණකොළ එහාමෙහා කරන්න විතරයි. තණකොළ කඩා ගන්න බෑ.




පාත්තයෝ පොකුණකට පීනන්න ගියා. මේ පාත්තයත් ගියා උන් එක්ක.

ඔක්කොම පාත්තයෝ පොකුණෙ පීනනවා. මේ පාත්තයා ඉවුරෙ එහා මෙහා දුවනවා. කොක් කකුල් හින්ද පීනන්න බෑ.

පාත්තයෝ "ගා-ගා-ගා!" ගාලා හිනාවෙනවා.

අර පාත්තයා "කුක්කු-කූ!" කියනවා.








පාත්තයේ ඔක්කොම ඉවුරට ආවා. ඔන්න එතකොට එතන නරියෙක්!

පාත්තයෝ කෑගහල ඉගිල්ලිලා ගියා.

මේ පාත්තයා විතරයි ඉතුරු වුණේ. කපුටු තටුවලින් ඌට ඉහළට ඉගිල්ලෙන්න බෑ. කොක් කකුල්වලින් දුවන්න පටන් ගත්තා. මොණර පිල් පැටලුණ හින්ද ඒකත් කරන්න බෑ.....



නරියා දිග හංස බෙල්ලෙන් පාත්තයාව ඩැහැ ගත්තා....

මේක දැක්කා පාත්තයෝ. උන් ඉගිල්ලි ඉගිල්ලි නරියට හැම පැත්තෙන්ම කොටන්න පටන් ගත්තා.

නරියා පාත්තයව අත ඇරල දිව්වා.




"උඹලට ස්තුතියි, උඹල මාව බේරාගත්තා! දැන් මම දන්නවා කරන්න ඕන දේ" පාත්තයා කීවා.

ඉතින් පාත්තයා හංසය ළඟට ගිහිල්ලා දිග බෙල්ල හංසයට දුන්නා. කරවැල් කොකාට සාක්කු හොට දුන්නා. මාන කොකාට හීන් කකුල් දුන්නා. කාක්කාට කළු තටු දුන්නා. මොණරාට ලස්සන පිල් දුන්නා. කරුණාවන්ත කුකුළාට කරමලයි, තැල්ලයි 'කුක්කු-කූවයි' දුන්නා.



පාත්තයා දූන් පාත්තයා මයි
ඉරිසිය නොකරයි නුවණක්කාරයි
පාත්තයා ගැන කතාව මේකයි
කතන්දරේ අපෙ ඔන්න ඔච්චරයි!







සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස



ලියනවා. මෙන්න මෙහෙම මගේ පුංචි මිතුරන්ට මගේ දැතින් ම හිත්ගන්නා විනෝදමත් කතන්දර හා පින්තූර දෙන්න මම මහන්සි ගන්නවා.

මේ පොත කියවනකොට මෙහි චිත්‍ර ඔබ බලනවා ඇතැයි මම හිතනවා. මගේ වීරයන්ට ආදරය කරතැයි මම හිතනවා. මගේ කතාවලින් ඔබ විනෝද වෙනවා විතරක් නෙමෙයි, ඒවා ගැන මොනව හරි හිතන්න, අඳින්න කරන්න ඔබට පුළුවන් වෙතැයි මම හිතනවා. බාගවෙලාවට ඔබ සන්තෝසෙන් නිකම්ම හිනාවෙන්න විතරක් පුළුවන්!

- ව්ලදිමීර් සුතේයෙව්

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

ISBN 978-955-1319-30-4

Rs. 900/-
9 789551 319304

Kanol PRINT







Progressive Publishing